





16 වන පිටෙන්

අතිජාතක මිත්‍රයා වන පාර්ලිමේන්තු මන්ත්‍රී සචින් වාස් ගුණවර්ධන යටතේ මිහින් ලංකා ගුවන් සමාගම ලැබූ පාඩුව අති විශාලය. ඒවා ගැන වචනයක් කතා නොකරන රාජපක්ෂ ආණ්ඩුව පාඩු ලබන පෞද්ගලික ආයතන ආණ්ඩුවට පවරා ගැනීමෙන් ලාභ උපදවන්නේ කෙසේද?

මහින්ද චින්තන ආණ්ඩුව 2005 දී බලයට පත්වුණේ රාජ්‍ය සම්පත් හෝ ශ්‍රී ලංකාවේ භූමිය කිසිවෙකුටත් නොවිකුණන බවට ප්‍රතිඥා දෙමිනි. එහෙත් අද වන විට ආණ්ඩුව මොන තරම් ඉඩම් වතු වනාන්තර ආයතන පිටරැටියන්ට බදු දී ඇද්දැයි විමසා බැලීම වටී. ඉතාමත් අඩු මුදලට මේවා පිටරැටියන්ට ලබාදී ඇත්තේ අතයට ලැබුණු ලොකු ලොකු කොමිස් කුට්ටි ද ආණ්ඩු සහචරයන් ගේ සාක්කු වලට පුරෝ ගමිනි.

තත්වය මෙසේ නම් මහින්ද රාජපක්ෂ ආණ්ඩුව අද ගමන් කරන්නේ කොයිබටද ? ආණ්ඩුවේ කීම සහ කෙරුවාව අතර ඇත්තේ විශාල පරතරයකි. ආණ්ඩුවේ මේ දෙබිඩි ප්‍රතිපත්තියට එරෙහිව අරගල කරන අය දේශ ද්‍රෝහීන්ය. ආණ්ඩුවේ ඕනෑම අසික්කිත වැඩක් අනුමත කරන අය දේශ ප්‍රේමීන්ය. ආණ්ඩුවේ හැදින්වීම එසේය.
මෙය ඉතාමත් භයානක තත්වයකි. මෙයට එරෙහිව පුළුල් ජනතා බලවේගයකින් ආණ්ඩුවට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. එහෙත් මේ පියවර ගැනීමට නම් ශක්තිමත් විපක්ෂයක් තිබිය යුතුය. අපට අද නැත්තේය. එයයි. එක්සත් ජාතික පක්ෂය විපක්ෂයක් යන්න නමට පමණක් තිබෙන දෙයකි. එහි කිසිදු විපක්ෂීය ක්‍රියාකාරීත්වයක් නැත. එක්සත් ජාතික පක්ෂය මෙන්ම ජනතා විමුක්ති පෙරමුණ ද පක්ෂ අභ්‍යන්තරයේ හටගත් අර්බුද හේතුකොටගෙන නිද්‍රාශීලී තත්වයකට පත්ව ඇත.

එවැනි ස්වභාවයක් තුළ වර්තමානයේ ජනතාව පත්ව ඇත්තේ දැඩි අසරණ තත්වයකටය. පවතින තත්වය තුළ විපක්ෂය නගා සිටුව හැකි එකම පුද්ගලයා ජෙනරල් සරත් ෆොන්සේකාය. අප එසේ ප්‍රකාශ කරන්නේ ඇයි ? සැබැවින්ම වර්තමානය වන විට ජනප්‍රිය තලයේ ක්‍රියාකාරී ජනතාවගේ වැඩිම ආකර්ශනයට ලක් වූ නිර්භීත චරිතයක් වන්නේ සරත් ෆොන්සේකාය. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව සමග බිය නොවී කරට කර හැප්පීමේ ශක්තියක් ඔහුට ඇත.

එබැවින් කුමන ක්‍රමයකින් හෝ ඔහුව සිර ගෙදරින් එළියට ගතහොත් රට තුළ විපක්ෂ ක්‍රියාකාරීන්ගේ ක්‍රියාකාරීත්වය ඉතාමත් විශාල වශයෙන් ඉහළ යනු ඇත. රාජපක්ෂ ආණ්ඩුව ද මෙය හොඳින් දන්නා දෙයකි. ඔහුට එළියට ඒමට නොහැකිව දිගින් දිගටම යකඩ කූඩු අතරේ සිර කර තැබීමට උත්සාහ කරන්නේ එබැවිනි.

ශ්‍රී ලාල් ප්‍රියන්ත

